**යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ [ආසබැ ණය අංක 2710-එස්ආර්අයි, 2711-එස්ආර්අයි (එස්එෆ්) සහ ඒඑෆ්ඩී ණය ගිවිසුම් අංක සීඑල්කේ 1003-01-ජේ ] - 2013**

---

යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි ( සාමාන්‍ය මෙහෙයුම් ) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය හා අංක 2711- එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව,එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන සහ ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජස හා ජම) සහ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ (පපාපසඅ) උතුරු පළාත් සභාව (උපස) මඟින් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත්වන පදිංචිකරුවන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීමයි. ව්‍යාපෘතිය සමන්විත වන්නේ, ජල සම්පාදන හා සනීපාරක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, යාපනය ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය වැඩි කිරීම සඳහා යාපනය ප්‍රාදේශීය කාර්යාලය (JRO) ඉදිකිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,326 කට සමාන එජඩො මිලියන 164.04 ක් වන අතර, එයින් රු මිලියන 10,055 කට සමාන එජඩො මිලියන 90 ක් හෙවත් සියයට 54.86 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වූ අතර,රු.මිලියන 5,362 කට සමාන එජඩො මිලියන 48 ක් හෙවත් සියයට 29.26 ක් මූල්‍යයනය කිරීම සඳහා "එජන්ස් ෆ්‍රැන්කයිස් ඩි ඩිවෙලොප්මන්ට්" (Agence Francaise de Development ) එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 2,909 කට සමාන එජඩො මිලියන 26.04 ක් හෙවත් සියයට 15.88 ක් ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) විසින් මූල්‍යායනය කිරීමට එකඟ වන ලදි. ව්‍යාපෘතියේ ඉරණමඩු සංරචකය පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරවන අතර ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය විසින් වෙන් කරන ලද අරමුදල් පිළිවෙලින් රු.මිලියන 1,513 කට සමාන එජඩො මිලියන 13.55 ක් හා රු.මිලියන 354 කට සමාන එජඩො මිලියන 3.17 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර 2017 පෙබරවාරි 14 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

-------------------------------------------

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ  සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම  මත පරික්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම් ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය  හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා  තිබුණේද යන බව.

(ඍ) ණය ගිවිසුම්වල නියම කරඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

--------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක අග්‍රිමය, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

---------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂයේ රු.183,593,533 ක් වූ වියදම සමඟ සැසඳීමේදී 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.271,120,778 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.454,714,311 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| -------- | -------------------------------------- | | --------------------- |
| | 2013 | 2012 | රු. |
| | රු. | රු. | |
| සිවිල් වැඩ | 95,003,555 | 140,341,560 | 235,345,115 |
| පරිසරය හා අවම කිරීම | - | 267,136 | 267,136 |
| ඉඩම් අත්පත් කර ගැනීම | 2,495,072 | - | 2,495,072 |
| මෝටර් වාහන | 23,504,399 | - | 23,504,399 |
| උපකරණ | - | 530,193 | 530,193 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | 963,613 | 3,563,422 | 4,527,035 |
| උපදේශක සේවා (RSC North) | 4,900,000 | - | 4,900,00 |
| උපදේශක සේවා (PIECE) | 107,669,191 | - | 107,669,191 |
| ව්‍යාපෘති පරිපාලනය හා ක්‍රියාත්මක කිරීම | 36,584,948 | 38,891,222 | 75,476,170 |
| | --------------- | --------------- | --------------- |
| එකතුව | 271,120,778 | 183,593,533 | 454,714,311 |

**4.2 අග්‍රිම අරමුදල් ගිණුම්**

**----------------------**

මූල්‍ය ප්‍රකාශනවලට හා ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුම්වල මෙහෙයුම් පහත දැක්වේ.

**ආසබැ ණය අංක 2710 - එස්ආර්අයි(එස්එෆ්)**

**-------------------------------------------------**

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,169,380 | 148,699,264 |
| එකතුකළා :- ඌනපූරණයන් | 233,802 | 30,594,144 |
| විදේශ විනිමය වාසිය | - | 3,472,943 |
| | ------------ | ------------ |
| | 1,403,182 | 182,766,351 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 317,925 | 40,865,811 |
| | ------------ | ------------ |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,085,257 | 141,900,540 |

**ආසබැ ණය අංක 2711 - එස්ආර්අයි(එස්එෆ්)**

**-------------------------------------------------**

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,992,521 | 253,370,569 |
| එකතුකළා :- ඌනපූරණයන් | 369,147 | 48,359,298 |

| | | |
|---|---|---|
| විදේශ විනිමය වාසිය | - | 6,595,863 |
| | ------------- | ------------- |
| | 2,361,668 | 308,325,730 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 423,427 | 55,417,998 |
| | ------------- | ------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,938,241 | 252,907,732 |

**5. ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

ණය ගිවිසුම්වල II ව්‍යවස්ථාවේ 2 වගන්තිය ප්‍රකාරව, එකතුව රු.20,114,260 ක් වූ දරන ලද බැඳීම් හා පොලී ගාස්තු ව්‍යාපෘතියේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

**6. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

----------------------------------------

**6.1 අරමුදල් උපයෝජනය**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | ආසබැ | | එජඩො (මිලියන) ඒඑෆ්ඩී(AFD) | ශ්‍රීලංර | එකතුව |
|---|---|---|---|---|---|
| | විශේෂ මෙහෙයුම් | සාමාන්‍ය මෙහෙයුම් | | | |
| ණය ගිවිසුම ප්‍රකාරව එකඟවූ දායකය | 70 | 20 | 48 | 26.04 | 164.04 |
| අඩු කළා - ඉරණමඩු ජලාශය ඉදිකිරීම් සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වෙන්කරන ලද අරමුදල් | 13.55 | - | - | 3.17 | 16.72 |
| | ---------- | ------- | --------- | -------- | ---------- |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා වෙන්කරන ලද අරමුදල් | 56.45 | 20 | 48 | 22.87 | 147.32 |
| | ===== | ==== | ===== | ===== | ===== |
| 2013 දෙසැම්බර් 31 දක්වා දරන ලද වියදම | 1.20 | 1.13 | 0.40 | 0.74 | 3.48 |
| | ====== | ===== | ===== | ===== | ==== |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් වශයෙන් | 2.12 | 5.65 | 0.83 | 3.23 | 2.36 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත විශ්ලේෂණයට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය ඉතා අඩු බව අනාවරණය විය.

(ආ) 2013 වර්ෂය සඳහා ජාතික අයවැය ලේඛනයේ රු.500,000,000 ක් හා රු.300,000,000 ක මුදලක් පිළිවෙලින් ව්‍යාපෘතියේ විදේශීය හා දේශීය වියදම් සඳහා වෙන් කර තිබුණද, පසුව රු.150,000,000 ක වෙන් කිරීමක් වෙනත් ව්‍යාපෘති සඳහා මාරු කර තිබූ අතර වෙන්කරන ලද දේශීය අරමුදල් වලින් රු.56,055,840 ක් පමණක් භාවිතා කර තිබුණි.

## 6.2 භෞතික කාර්ය සාධනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන ජල මූලාශ්‍රය ඉරණමඩු ජලාශයයි. කෙසේ වුවද ඉරණමඩු ජලාශය ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය ලෙස යොදාගැනීම පිළිබඳව ප්‍රදේශයේ ප්‍රජාවගේ විරෝධය හේතුවෙන් ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව, රු.මිලියන 102,47 කට සමාන එජඩො මිලියන 91.72 ක පිරිවැයකට පැකේජ 13 ක් යටතේ ව්‍යාපෘතියේ සමස්ත විෂය පථය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද භාණ්ඩ ප්‍රසම්පාදනය, ඉදිකිරීම් වැඩ, උපදේශක සේවා ආදිය සඳහා සිදුකරන වැඩ යටතේ සතුටුදායක ප්‍රගතියක් දක්වා නොතිබුණි.ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ පැහැදිලි කිරීමට අනුව, 2013 ජනවාරි මාසයේදී උපදේශක පත්කර තිබූ අතර ඔහු ප්‍රධාන වශයෙන් සංකල්පිත සැලසුම් හා ලංසු ලියවිලි පිළියෙල කිරීම් ආදී කාර්යයන්වල නියැලී තිබුණි. එබැවින් බෙදාහැරීම් ජාල පද්ධතිය සැලසුම් කිරීම සහ ජල කුළුණු ඉදිකිරීම ආදී අනෙකුත් කාර්යයන් ප්‍රමාද වී තිබුණි.